**සේවා ලාභී ප්‍රඥප්තිය**

| සේවාව | සේවාලාභියා කල යුතු දේ | සහය වන නිලධාරීන් | ගත වන කාලය |
|---|---|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීම් බලපත්‍රයක් නිකුත් කිරීම | කාර්යාලයට නියමිත ගාස්තු ගෙවා ලදුපතක් ලබා ගෙන ගොඩනැගිලි ඉල්ලුම්පත්‍රය ලබා ගත යුතුය | කළමණාකරන සහකාර | විනාඩි 05 |
| **අදාල අණ පනත් හා නිති රීති**<br>1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනත<br><br>1978 අංක 41 දරණ නාගරික සංවර්ධන පනත | ඉල්ලුම්පත්‍රය නිසිපරිදි පුරවා පහත ලියවිලි සමග භාරදිය යුතුයි<br>1. ඉඩමේ ඔප්පුව පිටපත් 01<br>2. ඔප්පුවට අදාල සැලැස්ම පිටපත් 01<br>3. සංවර්ධන සැලැස්ම පිටපත් 03<br>4.පෙරසැරි ගාස්තුව සමග පරීක්ෂණ ගාස්තුව ගෙවිය යුතුය<br>5 .සේවා ගාස්තුව අදාල නම් ගෙවිය යුතුය<br>6 .ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් ඉදිකිරීම් භූමියේ යෝග්‍යතා සහතිකය ලබා ගෙන ඉදිරිපත් කල යුතුය.<br>7. එක් වරකට දෙනු ලබන බලපත්‍රය අනුව ඉදිකිරීම සිදු කල නොහැකි වුවහොත් සාධාරණ හේතු ඉදිරිපත් කර කාලය දීර්ග කර ගත යුතුය.<br>8. ඉදිකිරීම අවසන් වූ පසුව කාර්යාලයට දැනුම් දීම<br>9. අනුකුලතා සහතිකය ලබා ගැනීමට කටයුතු කල යුතුය. | කළමණාකරන සහකාර<br>කාර්මික නිලධාරී<br><br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී<br>ප්‍රාදේශිය සභා ලේකම්<br>ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ භූ විද්‍යාඥ | මාස 02 |

**<u>සේවා ලාභී ප්‍රඥප්තිය</u>**

| සේවාව | සේවා ලාභියා කල යුතු දේ | සහය වන නිලධාරීන් | ගතවන කාලය |
|---|---|---|---|
| වරිපනම් බදු/අක්කර බදු ලේඛන වලට දේපල හිමිකාරිත්වය පිළිබඳව අලුතින් නමක් ඇතුලත් කිරීම හෝ ඇතුලත්ව ඇති නම /නම් සංශෝධනය කිරීම<br><br>**<u>අදාල අණ පනත් හා නීති රීති</u>**<br><br>1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනත | I දේපල පිළිබඳ විස්තර , ස්ථානය, වරිපනම් අංකය (පැරණි වරිපනම් අංකය සංශෝධනයේදී නම්) තමාට හිමිකම පැවරූ ඔප්පුවේ හා සැලසුමේ ජායා පිටපත් සමග ආකෘති පත්‍රයක් කාර්යාලයෙන් ලබා ගැනීම. (නියමිත ගාස්තු ගෙවා ලදුපතක් ලබා ගත යුතුවේ.)<br><br>II නොතාරිස්වරයෙකු ලවා ඉහත ආකෘති පත්‍රය සහතික කරවා ගැනීම.<br><br>III නම් සංශෝධනයේදී නිවැරදි හිමිකම ඔප්පු කල නොහැකි නම් ආදායම් පරිපාලක මගින් වාර්තාවක් ලබා ගැනීම<br><br>IV නිවැරදිව පුරවා භාර දෙන අයඳුම් පත්‍රය කාර්යාලය මගින් ලේඛන හා තොරතුරු සසඳා බලා නිවැරදි නම් තක්සේරු දෙපාර්තමේන්තුවට යවනු ලැබේ.<br><br>තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නම සංශෝධනය කල හැකි බව දන්වා එවීමෙන් පසුව ලේඛනයේ නම ඇතුලත් කිරීම/සංශෝධනය කිරීම සිදු කරනු ලැබේ. | ලේකම්<br>ප්‍රධාන කලමනාකරණ සහකාර<br><br>විෂය භාර කළමනාකරණ සහකාර<br><br>ආදායම් පරිපාලක<br><br>තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් | සතියකි<br><br>තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලිපිය ලද වහාම |

**<u>සේවා ලාභී ප්‍රඥප්තිය</u>**

| සේවාව | සේවා ලාභියා කල යුතු දේ | සහය වන නිලධාරීන් | ගතවන කාලය |
|---|---|---|---|
| දේපොල හා ජීවිත වලට අනතුරුදායක ලෙස පිහිටා ඇති ගස් කැපීම, ගස් වල අතු කැපීම පිනිස නියෝග නිකුත් කිරීම හා එම නියෝග ක්‍රියාත්මක කරවීම<br><br>**<u>අණ පනත් හා නීතිරීති</u>**<br><br>1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 107 වැනි වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල | නියමිත ගාස්තුව ගෙවා ආකෘති පත්‍රය ලබා ගැනීම හා නිසිපරිදි පුරවා භාරදීම<br><br>කාර්මික නිලධාරී මගින් ස්ථානිය පරීක්ෂණයක් සිදු කර නිවේදන නිකුත් කිරීම කාර්යාලය මගින් සිදු කරනු ලැබේ.<br><br>නිවේදන අනුව ගස/ගස් හිමියන් විසින් අදාල කාර්යය සිදු නොකරයි නම් නැවත කාර්යාලයට දැනුම් දීම<br><br>දෙවන හා තුන්වන නිවේදන කාර්යය මගින් නිකුත් කිරීමෙන් පසුව අදාල කාර්යය ඉටුනොවේ නම් ප්‍රාදේශිය සභාව මගින් එම ගස/ගස් කැපීම, අතු කපා දැමීම සිදු කරනු ලැබේ. | විෂය භාර නිලධාරී<br>කාර්මික නිලධාරී | වි:10<br><br>දින 03 ක් ඇතුලත<br><br>සතියයි |

**සේවා ලාභී ප්‍රඥප්තිය**

| සේවාව | සේවා ලාභියා කල යුතු දේ | සහය වන නිලධාරීන් | ගතවන කාලය |
|---|---|---|---|
| වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම | ප්‍රථම වතාවට පැමිනි රෝගියෙකු කවුන්ටරයෙන් තමාට අදාල බෙහෙත් වට්ටෝරු පත්‍රයක් හා තුන්ඩුවක් ලබා ගත යුතුය. | බෙහෙත් තුන්ඩු නිකුත් කරන නිලධාරී | වි:02 |
| | නැවත පැමිණි රෝගියකු නම් කලින් නිකුත් කල තුන්ඩුව ඉදිරිපත් කර වට්ටෝරු පත්‍රය ලබා ගත යුතුය. | ආයුර්වේද වෛද්‍යවරිය | රෝගී තත්ත්වය මත කාලය වෙනස් වේ. |
| | වෛද්‍යවරයෙකු හමු වී රෝගී තත්ත්වය සඳහා ප්‍රතිකාර ලබා ගැනීම. | ඖෂධවේදිනිය | |
| | ඖෂධ ප්‍රතිකාර සඳහන් කල බෙහෙත් වට්ටෝරු පත්‍රය බෙහෙත් ලබා දෙන කවුන්ටරය වෙත ඉදිරිපත් කර බෙහෙත් ලබා ගැනීම. (බෝතල් ඉදිරිපත් කල යුතු අවස්ථා වලදී පිරිසිදු කරන ලද වීදුරු බෝතල් ඉදිරිපත් කල යුතුය) | | වි:10-15 |

**<u>සේවා ලාභී ප්‍රඥප්තිය</u>**

| සේවාව | සේවා ලාභියා කල යුතු දේ | සහය වන නිලධාරීන් | ගතවන කාලය |
|---|---|---|---|
| වෙළඳ ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත් කිරීම | ප්‍රාදේශිය සභාව මගින් ලබා දෙන අයදුම්පත නිසි පරිදි පුරවා කාර්යාලයට භාරදීම | විෂය භාර නිලධාරී | වි:05 |
| **<u>අනපනත් හා නිති රීති</u>** | බලපත්‍ර ගාස්තුව කාර්යාලයට ගෙවා මුද්‍රිත ලදුපතක් ලබා ගැනිම | අවශ්‍ය වුවහොත් ලේකම් | දින 03 |
| 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනත | (බලපත්‍රය ලබාදීමට පෙර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමුකර වාර්තාවක් ලබාගන්නා අතර එහිදී නිර්දේශය ලබා දෙන ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත් කෙරේ.) | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | |

**<u>සේවා ලාභී ප්‍රඥප්තිය</u>**

| සේවාව | සේවා ලාභියා කල යුතු දේ | සහය වන නිලධාරීන් | ගතවන කාලය |
|---|---|---|---|
| පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම | අයදුම්පත්‍රය සමග සත්‍ය ලියවිලි ඉදිරිපත් කල යුතුය | විෂය භාර කළමනාකරණ සහකාර | වි:05 |
| | ඉඩමේ ඔප්පුව , ඉඩමේ පිඹුර, වෙළඳ බලපත්‍රය , ව්‍යාපාරයේ නම හා ලියාපදිංචි සහතිකය, ඉදිරිපත් කල යුතුයි. | භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නිලධාරීන් | |
| | ගල් වලක් සඳහා නම් පතල් කැනීම් හා භූ විද්‍යා කාර්යාංශයෙන් ලබාගත් කැනීම් බලපත්‍රයේ පිටපතක් ඉදිරිපත් කල යුතුය. | අඩවි වන නිලධාරී | |
| | ලී මඩු /වඩු මඩු සඳහා නම් අදාල ස්ථානය රක්ෂිත වනාන්තරයකට ආසන්න නොවන බවට වන රක්ෂණ නිලධාරීගෙන් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කල යුතුය. | | |
| | ස්ථානීය පරීක්ෂණ සඳහා පරීක්ෂණ ගාස්තුව ආයෝජන මුදල අනුව ගෙවිය යුතුය. | ප්‍රාදේශීය පරිසර නිලධාරීන්<br>මහජන සෞඛ්‍ය පරීක්ෂක | සති 1 1/2 |
| | නිර්දේශ සඳහා තාක්ෂණ ප්‍රගති සමාලෝචන කමිටුවට ඉදිරිපත් කිරීම කාර්යාලය විසින් සිදු කෙරේ. | කාර්මික නිලධාරී | |
| | පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව ගෙවිය යුතුය.<br>(ඉන් පසු බලපත්‍රය නිකුත් කෙරේ) | ලේකම්<br>විෂය භාර නිලධාරී<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී<br>ප්‍රාදේශීය සභාව | දින 01 |
| | | අඩවි වන නිලධාරී<br>කෘෂි උපදේශක<br>ප්‍රාදේශීය පරිසර නිලධාරී<br>කාර්මික නිලධාරී<br>ආදායම් පරිපාලක | දින 01 |

**<u>සේවා ලාභි ප්‍රඥප්තිය</u>**

| සේවාව | සේවා ලාභියා කල යුතු දේ | සහය වන නිලධාරීන් | ගතවන කාලය |
|---|---|---|---|
| මහජන පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීම | අදාල ගාස්තු ගෙවා අයදුම්පත්‍රයක් ලබා ගැනීම<br><br>ඉල්ලුම් පත්‍රයේ ඇති පරිදි නිලධාරියකු ලවා එය සහතික කරවා ගෙන පුස්තකාලයට භාරදීම | පුස්තකාලයාධිපති | වි:02<br><br>සේවා ලාභියාගේ ක්‍රියාකාරීත්වය<br><br>නියමිත පරිදි භාරදුන් ඉල්ලුම්පත්‍රය සඳහා කාඩ් පත නිකුත් කිරීම |

**<u>සේවා ලාභී ප්‍රඥප්තිය</u>**

| සේවාව | සේවා ලාභියා කල යුතු දේ | සහය වන නිලධාරීන් | ගතවන කාලය |
|---|---|---|---|
| වීථි රේඛා, නොපරවා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම | කාර්යාලයේ අයඳුම්පත්‍රයක් ලබාගෙන එය නිසි පරිදි පුරවා ඉඩමේ ඔප්පුවේ පිටපතක්, ඉඩමේ සැලැස්මෙහි පිටපතක්, ග්‍රාම නිලධාරී විසින් ඉඩම පිළිබඳ ලබාදෙන සහතිකයක් සමග කාර්යාලයට භාර දිය යුතුය.<br>(අයඳුම් පත්‍රය සඳහා අයඳුම්පත්‍ර ගාස්තුව ගෙවිය යුතුය. වීථි රේඛා අනුමත ගාස්තුව ගෙවිය යුතුය) | විෂය භාර නිලධාරී | වි:10 |
| **<u>අදාල අණපනත් හා නීතිරීති</u>**<br>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | මීට අමතරව නිඟ වරිපනම් බදු හා අක්කර බදු ඇත්නම් ගෙවිය යුතුය. | කාර්මික නිලධාරී | දින 01 |
| | අයඳුම් පත්‍රය කාර්මික නිලධාරී වෙත යොමු කිරීම කාර්යාලය මගින් සිදු කෙරේ. (කා.නි වාර්තාව ලබා ගැනීම) | විෂයභාර නිලධාරී | කාර්මික නිලධාරී වෙතින් නිර්දේශිත අයඳුම්පත්‍රය විෂය ලිපිකරු වෙත ලැබුනු පත්‍ර පැය 01 ක් තුල සහතිකය නිකුත් කෙරේ. |